සැ.යු.- 2017.03.31 දින පළ වූ අංක 2013 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,014 - 2017 අප්‍රේල් මස 07 වැනි සිකුරාදා - 2017.04.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 756 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 766 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


සැ. යු. - (i) ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත 2017 මාර්තු මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) විදේශ විනිමය පනත් කෙටුම්පත 2017 මාර්තු මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 අප්‍රේල් මස 28 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 අප්‍රේල් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## කඩුගන්නාව නගර සභාව

### කඩුගන්නාව නගර සභාවේ ප්‍රාථමික මට්ටමේ ශිල්පීය නොවන ආයතනගත තනතුරුවල පුරප්පාඩු පිරවීම

කඩුගන්නාව නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් උපලේඛනයේ තනතුරුවලට බඳවා ගැනීමට උපලේඛනයේ සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලද කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත ක්‍රමය හා වැටුප් පරිමාණය* | *අවශ්‍ය අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | ඖෂධ සංයෝජක | 01 | වැටුප් කේතය<br>PL-02-2016/Grade III<br>වැටුප් ක්‍රමය<br>රු. 25,250-10 x 270- 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450<br><br>මුල් පත්වීමේ දින සිට රා. ප. ච. ලේ. 3/2016 ii උපලේඛනය පරිදි 14818/වැටුප් පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ. | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම.<br><br>***ශිල්පීය නිපුනතා/ප්‍රවීනතා :***<br>අදාළ තනතුරට නියමිත කාර්මික නිපුනතා පත්වීම් බලධාරියා විසින් අපේක්ෂා කරන මට්ටමට අත්පත් කරගෙන තිබිය යුතුය.<br>*අ.* වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමේ (NVQ2) හෝ (NVQ3) සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>*ආ.* කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>*ඇ.* ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>*ඈ.* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>*ඉ.* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br><br>***පළපුරුද්ද :***<br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම. (පුහුණු කාල සීමාව යටත් පිරිසෙයින් අවුරුදු 2 ක් වත් විය යුතුය.) |

| | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත ක්‍රමය හා වැටුප් පරිමාණය | අවශ්‍ය අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|---|
| 02. | වැඩ කෂේත්‍ර කම්කරු | 02 | *වැටුප් කේතය*<br>PL-1-2016 Grade III<br><br>*වැටුප් ක්‍රමය*<br>රු. 24,250- 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 මුල් පත්වීමේ දින සිට රා. ප. ච. ලේ. 3/2016 හි ii උපලේඛනය පරිදි රු. 14,234 වැටුප් පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ. | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. |
| 03. | සෞඛ්‍ය කම්කරු | 01 | *වැටුප් කේතය*<br>PL1-2016 Grade III<br><br>*වැටුප් ක්‍රමය*<br>රු. 24,250-10 x 250- 10 x 270- 10 x 300 - 12 x 330 - රු. 36,410 මුල්පත්වීමේ දින සිට රා. ප. ච. ලේ. 3/2016 හි ii උපලේඛනය පරිදි රු. 14,234 වැටුප් පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ. | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. |

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

3.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය,

3.2 වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

3.3 තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් විය යුතුය.

3.4 මෙම බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රජය හා මධ්‍යම පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන නියෝග හා රෙගුලාසිවලට යටත්ව සේවය කිරීමට බැඳී සිටී.

04. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
2. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස්පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවකයන් ස්ථිර සේවයේ යෙදෙන තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
4. දැනට කඩුගන්නාව නගර සභාවේ තාවකාලික/අනියම්/ආදේශක පදනම මත සේවයේ නියුතු සේවකයින්ට වැඩි අවධානයක් යොමුකරනු ලැබේ.
5. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් සිටිය යුතුය.
6. විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරාගනු ලබයි.
7. දණ්ඩනීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු හෝ දඬුවම් ලැබූවකු නොවිය යුතුයි.
8. අයදුම්පත කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය කඩුගන්නාව නගර සභාවේ ලේකම් සතුය.

05. *අයදුම් කිරීමේ පිළිවෙල :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ අයදුම්පතක් සකස් කර ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2017 මැයි මස 09 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ ''ලේකම්, කඩුගන්නාව නගර සභාව, කඩුගන්නාව'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතික
3. හැඳුනුම්පතේ ඡායා පිටපතක්
4. පදිංචිය සනාථ කිරීමේ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය
5. මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්
6. පළපුරුද්ද වෘත්තීය සුදුසුකම් සම්බන්ධ සහතික :

ඩී. එම්. පී. කේ. දිසානායක,<br>
ලේකම්,<br>
කඩුගන්නාව නගර සභාව.

2017 මාර්තු මස 16 වැනි දින,<br>
කඩුගන්නාව නගර සභා කාර්යාලයේදී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කඩුගන්නාව නගර සභාවේ........................ තනතුර සඳහා වූ අයදුම්පත්‍රය***

01. මුලකුරු සමඟ නම :————————————.
02. මුලකුරු වලින් හැඳින්වෙන නම් :————————————.
03. ස්ථිර ලිපිනය :————————————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————————.
05. ජාතික හැඳුනුම්පත් අංකය :————————————.
06. උපන්දිනය :————————————.
    අවුරුද්ද:————— මාසය:————— දිනය:—————
07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස
    අවුරුදු :—————මාස :————— දින :—————
08. ස්ත්‍රී/පුරුෂ භාවය :————————————.
09. විවාහක/අවිවාහක බව:————————————.
10. ශ්‍රී ලංකා පුරවැසියකුවන්නේ උපතින්ද? ලියාපදිංචිවීමෙන්ද?:————————————.
11. අධ්‍යාපන සුදුසුකම්:————————————.
12. වෙනත් සුදුසුකම්:————————————.
13. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් –
    (1) දැනට දරන තනතුර :————————————.
    (2) ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් ද යන වග:————————————.
    (3) එම තනතුරට පත්වූ දිනය:————————————.
14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේද?:—————————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසුව ඔප්පුවුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත්වන බව ද දනිමි.

————————————.<br>
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————————.

*දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/කාරිය වන.......................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ.................................... වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුරු සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ නොහැකි/හැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :—————————————.
තනතුර:—————————————.
නිලමුද්‍රව :—————————————.
දිනය :—————————————.

04-07

---

## හලාවත ප්‍රාදේශීය සභාව

හලාවත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේතය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | බරවාහන ක්‍රියාකරු | 01 | PL3-2016 | රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 12 x 350 - රු. 38,990 (මෙම වැටුප හිමිවන්නේ 2020.01.01 වන දින සිට වන අතර, 3/2016 චක්‍රලේඛයේ උපලේඛන 11 හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ. | *බාහිර අයදුම්කරුවන් සඳහා :*<br>(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06 ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 05 ක් සමත් විය යුතුය.<br><br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br>(ආ) දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය.<br><br>මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට ප්‍රාථමික ශිල්පීය තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේතය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | | *ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා හා පළපුරුද්ද :-*<br><br>තාර බර හොන්ඩර් 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබීම ( A පංතියේ රියැදුරු බලපත්‍රයක්) හා මෙම තනතුර සඳහා තිබිය යුතු පළපුරුද්ද ලෙස අයි. ටී. ඒ. ටී. (I.T.A. T.) සහතිකය ලබා තිබීම හා බර වාහන රියැදුරෙකු වශයෙන් වසර 05 ක පළපුරුද්දක් තිබීම. |
| 02. | නළ ළිං කාර්මික | 01 | PL2-2016 | රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - 38,450 (මෙම වැටුප හිමිවන්නේ 2020.01.01 වැනි දින සිට වන අතර, 3/2016 චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ. | *බාහිර අයදුම්කරුවන් සඳහා*<br><br>*(අ)* අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර)<br><br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා*<br><br>*(ආ)* දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය.<br><br>මෙම පරිපාටිය ක්‍රියාත්ම වන දින වන විට ප්‍රාථමික ශිල්පීය තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාල වේ.<br><br>*ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා හා පළපුරුද්ද :*<br><br>තනතුරේ කාර්යභාරයට අදාළව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන N. V. Q. 2 හෝ 3 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හා පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පුහුණු කාලය වසර 02 ක පළපුරුද්දක් තිබීම (සේවා සහතික මගින් සනාථ කළ යුතු වේ.) |

02. ඉහත සඳහන් සියලු තනතුරු වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි අනුව පාලනය වේ.

03. *වයස* :- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි අයකු විය යුතුය. දැනටමත් පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන්ට ද, මෙම ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ටද, ඔවුන්ට පමණක් පෞද්ගලික වන සේ උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

04. *වෙනත් කොන්දේසි* :

(i) සෑම තනතුරකට ම බඳවා ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ 11වන පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාළ වේ,
(ii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය,
(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03 ක් තුළ හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය,
(iv) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත අයෙකු විය යුතුය,
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

05. *පත්වීමේ ස්වභාවය* :-

1. මෙම තනතුර ස්ථිරය. රජයේ සේවකයින් සඳහා 2016 ජනවාරි මස සිට ක්‍රියාත්මක කිරීමට රජය විසින් තීරණය කරනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමය ඔබට අදාළ වනු ඇත. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

06. තනතුර සඳහා ඉල්ලීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2017.05.15 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ''ලේකම්, හලාවත ප්‍රාදේශීය සභාව, මාදම්පේ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතු ය.

07. තනතුරු එකකට වැඩි ගණනක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතු ය.

08. අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය,
(ii) ජාතික හැඳුනුම්පත,
(iii) අධ්‍යාපන සහතික,
(iv) ස්ථිර පදිංචිය තහවුරු කිරීමේ සහතිකය (ග්‍රාම නිලධාරී සහතිකය),
(v) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (ඉන් එකක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරියාගෙන් විය යුතු ය),
(vi) වෘත්තීය පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික,
(vii) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

*බඳවා ගැනීමේ ක්‍රමය* :-

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය මත බඳවා ගැනීම් සිදු කෙරේ. දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනමින් සේවය කරන අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමිවනු ඇත.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල හලාවත ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

ආර්. ජේ. ඒ. එස්. හේමලතා,
ලේකම්,
හලාවත ප්‍රාදේශීය සභාව.

2017 මාර්තු මස 16 වැනි දින,
මාදම්පේ,
හලාවත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

හලාවත ප්‍රාදේශීය සභාවේ.............................. තනතුර සඳහා අයදුම්පත්‍රය

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :——————————.
02. ලිපිනය :——————————.
03. දුරකථන අංකය :——————————.
04. උපන් දිනය :——————————.
වර්ෂය :————— මාසය :————— දිනය :—————
05. ජාතික හැඳුනුම්පත් අංකය :—————
06. ජාතිය :——————————.
07. විවාහක/අවිවාහක බව :——————————.
08. 2017.05.15 වැනි දිනට වයස :——————————.
වර්ෂ :————— මාස :————— දින :—————
09. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද :——————————.
එසේ නම් පරම්පරාවෙන් ද/ලියාපදිංචියෙන් ද :——————————.
10. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
11. අධ්‍යාපන සුදුසුකම් :——————————.
(පිටපත් අමුණා එවිය යුතුය)
12. වෙනත් සුදුසුකම් :——————————.
13. පළපුරුද්ද :——————————.
14. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාල සීමාව :——————————.
——————සිට —————— දක්වා
15. පෙර සේවය කර ඇති ස්ථාන :——————————.
16. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියක වරදකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ
විස්තර:——————————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි වන අතර, යම් හෙයකින් මා සාවද්‍ය තොරතුරක් සපයා ඇත්නම් පත්වීම් ලබා දීමෙන් අනතුරුව නිසි වන්දියකින් තොරව මා සේවයෙන් ඉවත් කළ හැකි බව ද, ඊට පෙර අනාවරණය වුවහොත් මෙම තනතුර ලබා ගැනීම සඳහා මා සුදුසසෙකු නොවන බව ද මම දනිමි. අයදුම්පත් කැඳවීමේ දැන්වීමේ සඳහන් කරුණුවලට එකඟවන බවත් මෙයින් සහතික කරමි.

පහත සඳහන් ලිපි ලේඛනවල ඡායා පිටපත් මෙයට අමුණා ඇත :-

01. උප්පැන්න සහතික,
02. අධ්‍යාපන සහතික,
03. වෙනත් සුදුසුකම් දක්වෙන සහතික,
04. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,
05. ස්ථිර පදිංචිය තහවුරු කිරීමේ සහතිකය (ග්‍රාම නිලධාරි සහතිකය),
06. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක්

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතනයේ ප්‍රධානියාගේ සහතිකය*

ඉහත අයදුම්කරු..................................... දින සිට මෙම ආයතනයේ...................................වශයෙන් සේවය කරන බවත්, ඔහු/ඇය විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මෙයින් සහතික කරමි.

——————————,
අත්සන.

දිනය :——————————.

04-44

## මතුගම ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

මතුගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| 01. මුරකරු (ශිල්පීය නොවන) | 01 | PL-1 2016 රු. 24,250-250 x 10- 270 x 10 - 300 x 10 - 330 x 12 - රු. 36,410 (මුල් පත්වීමේ දින සිට වසර 3 ක් ගත වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. (මින් විෂයන් 5ක් එක්වර සමත් විය යුතු ය.) |
| 02. සෞඛ්‍ය කම්කරු (ශිල්පීය නොවන) | 01 | PL-1 2016 රු. 24,250 -250 x 10 - 270 x 10 - 300 x 10 - 330 x 12 - රු. 36,410 (මුල් පත්වීමේ දින සිට වසර 3 ක් ගත වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.) | 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුයි. |
| 03. ශ්‍රවණාගාර භාරකරු (ශිල්පීය නොවන) | 01 | PL-1 2016 රු. 24,250-250 x 10- 270 x 10 - 300 x 10 - 330 x 12 - රු. 36,410 (මුල් පත්වීමේ දින සිට වසර 3 ක් ගත වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. (මින් විෂයන් 5ක් එක්වර සමත් විය යුතු ය.) |

02. බඳවා ගැනීමේ ක්‍රමය:

I. ආයතනයේ කාර්යයන් ඉටු කිරීමට හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන පොදු මූලික අවශ්‍යතාවයන් අතුරින් නිශ්චිත අර්ධ ශිල්පීය හෝ ශිල්පීය නිපුණතාවයකින් තොරව ඉටුකළ හැකි මූලික කාර්යයන් සපුරාලනු ලබන බහු කාර්ය සේවා ගණයක් ලෙස මෙම සේවා ගණය සැලකේ. එබැවින් ඉහත තනතුරුවලට අදාළ කාර්යය පථයන් අතුරින් ලේකම් විසින් පවරනු ලබන ඕනෑම කාර්යයක් කිරීමට සක්‍රීයව සේවය ලබා දිය හැකි අයදුම්කරුවන් කෙරෙහි වැඩි ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.

II. මූලික සුදුසුකම් සලකා බැලීමේ සම්මුඛ පරීක්ෂණයේ දී මූලික අධ්‍යාපන සුදුසුකම් සලකා බැලීමට අමතරව ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය හා පෞරුෂත්වය සලකා බලන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ද අයදුම්කරුවන් පෙනී සිටිය යුතු අතර වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙල අනුව බඳවාගනු ලැබේ.

03. *වයස* :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු අවු. 45ට නොවැඩි විය යුතුය.

04. *වෙනත් සුදුසුකම්* :

(i) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ii) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(iii) අයදුම්කරුවන් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට බස්නාහිර පළාත් තුළ වසර 3කට නොඅඩු කාලයක් තුළ ස්ථිර පදිංචි කරුවකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ග්‍රාම නිලධාරි/ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)

(iv) මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු කාලයක් තුළ ස්ථිර පදිංචිය සනාථ කරන දැනටමත් මතුගම ප්‍රාදේශීය සභාවේ අනියම් ආදේශක හෝ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන අයදුම්කරුවන් කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(v) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ආයතන විසින් සේවයෙන් පහ කරනු ලැබූ අයෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතුය.

(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ අධිකරණය මගින් දඬුවම් පමුණුවනු ලැබූ අයෙකු නොවිය යුතුය.

(vii) අවශ්‍ය වෙතොත් සභාව විසින් නියම කරනු ලබන ඇපයක් මුදලින් හෝ රක්ෂණ සහතිකයක් මගින් තැබීමට සූදානම් විය යුතුය.

(viii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් *ගැසට්* පත්‍රයේ සඳහන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

05. *පොදු කොන්දේසි* :

(i) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර මනා පෞරුෂයකින් යුක්ත විය යුතුය.

(ii) මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

(iii) තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් ය.

(iv) පරිවාස කාලය අවසානයේ ස්ථිර කිරීම සලකා බලනු ලැබේ.

(v) බඳවා ගැනීමෙන් පසුව ඔබ විසින් ඉදිරිපත් කර ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ වෙනත් සුදුසුකම් ව්‍යාජ හෝ අසත්‍ය බවට තහවුරු වුවහොත් වෙනත් කිසිදු දැනුම් දීමකින් තොරව පත්වීම අවසන් කරනු ලැබේ.

06. *අයදුම්පත්* :

අයදුම්කරුවන් මෙම උපලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2017.04.28 දිනට පෙර ලේකම්, ප්‍රාදේශීය සභාව - මතුගම යන ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "අයදුම්කරන තනතුර" සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන හා තැපෑලේදී නැතිවන අයදුම්පත් පිළිබඳව වගකියනු නොලැබේ.

07. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

08. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකපත් වල පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතුය.

*(අ)* උප්පැන්න සහතිකය,

*(ආ)* අධ්‍යාපන සහතික,

*(ඇ)* පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් සහතිකය / ඡන්ද නාම ලේඛනයේ පිටපත,

(ඈ) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් (එකක් පදිංචි වසමේ ග්‍රාම සේවා නිලධාරිගෙන්),
(ඉ) වෘත්තීය පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් දක්වෙන සහතික,
(ඊ) මතුගම ප්‍රාදේශීය සභාවේ දැනටමත් අනියම්, ආදේශක හෝ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන්නේ නම් සේවය තහවුරු කිරීම සඳහා ආයතන ප්‍රධානියා නිකුත් කළ සහතිකය.

09. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල මතුගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

10. බඳවා ගන්නා දිනට තිබෙන සියලුම පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලබන බැවින් ඉහත සඳහන් තනතුරුවල සංඛ්‍යාවන් වෙනස් වීමට ද ඉඩ තිබේ.

අසෝක රණසිංහ,
ලේකම් හා මතුගම ප්‍රාදේශීය සභාවේ බලතල,
කාර්ය, කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,

2017 මාර්තු මස 23 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

**මතුගම ප්‍රාදේශීය සභාව**

.............................. තනතුර සඳහා අයදුම්පත්‍රය

01. අයදුම්කරුගේ නම/ මුලකුරු සමග :——————————.
මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————.
02. තැපැල් ලිපිනය :——————————.
03. උපන් දිනය : අවුරුද්ද :—————— මාසය :—————— දිනය :——————
04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :—————— මාස :—————— දින :——————
05. විවාහක/අවිවාහක බව :——————————.
06. ජාතිය :——————————.
07. ඔබ ශ්‍රී ලංකා පුරවැසියයෙක්ද? එසේනම් පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන්ද? යන වග :——————————.
08. අධ්‍යාපන සුදුසුකම් :——————————.
09. වෘත්තීය සුදුසුකම් :——————————.
10. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කරන්නේ නම් ඃ
(i) දැනට දරන තනතුර :——————————.
(ii) එම තනතුරට පත්වූ දිනය:——————————
(iii) එම පත්වීමේ ස්වභාවය (අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත ද යන වග) :——————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

04-134

# පළාත් පාලන නිවේදන

## අතුරු ව්‍යවස්ථාව

### වරකාපොළ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ වරකාපොළ ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත් සභාව.

2017 මාර්තු මස 15 වැනි දින.

## අතුරු ව්‍යවස්ථා

### වරකාපොළ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 69/126 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 122 වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වරකාපොළ ප්‍රාදේශීය සභාව සාදනු ලැබූ සහ 2014.01.28 වැනි දින පැවති එකී ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ තීරණ අංක 07-01 දරන යෝජනාව මගින් සම්මත වී ඇති මෙහි පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වන වගන්තියේ ප්‍රකාර සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, මහීපාල හේරත් වන මවිසින් අනුමත කරන ලද බවත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දින සිට එකී අතුරු ව්‍යවස්ථාව වරකාපොළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
සබරගමුව පළාත.

### ක්‍රීඩා භූමි පරිහරණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

***වරකාපොළ ප්‍රාදේශීය සභාව***

01. මෙම අතුරු ව්‍යවස්ථාව වරකාපොළ ප්‍රාදේශීය සභාවට අයත් පොදු ක්‍රීඩා භූමි විධිමත් කිරීම පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. වරකාපොළ ප්‍රාදේශීය සභාව සතු කිසියම් ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීම සඳහා අවසරපත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන යම් තැනැත්තෙකු මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල පළමු වන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කළ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය.

03. දෙවන වගන්තියේ සඳහන් පරිදි ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන යම් තැනැත්තෙකු වෙත වරකාපොළ ප්‍රාදේශීය සභා සතු කිසියම් ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමේදී මෙහි පහත දැක්වෙන කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස වරකාපොළ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් අවසර පත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

*(අ)* ක්‍රීඩා භූමි ප්‍රයෝජනය ගැනීමට අවසර පත්‍රයක් ඉල්ලීම සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම ප්‍රාදේශීය සභා කාර්යාලයට ලැබුණු අනුපිළිවෙල අනුව සලකා බැලිය යුතුය. එසේ වුවද ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීමට ලැබෙන අයදුම්පත්‍ර අතරින් කිසියම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩාවකට සම්බන්ධ යම් කාරණයක් සම්බන්ධයෙන් වන අයදුම්පත්‍රයට ඉහළ ප්‍රමුඛතාවය දිය යුතුය.

*(ආ)* මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙවන උපලේඛනයේ සඳහන් ගාස්තු ගෙවීමෙන් අනතුරුව ලබා ගත් අවසර පත්‍රයක් ඇත්තේ නම් මිස ක්‍රීඩා පිටිය භාවිතය සඳහා කිසිවෙකුට හිමිකමක් නොතිබිය යුතුය.

*(ඇ)* මෙම ගාස්තු වරකාපොල ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට නියම කරනු ලබන ගාස්තු සංශෝධනයන්ට යටත් වන අතර මෙම ගාස්තුවට අමතරව රජය විසින් කලින් කලට පනවනු ලබන බදු ගාස්තුද එකතු කර අය කරනු ලබන්නේය.

04. පරිහරණය කිරීම සඳහා ක්‍රීඩා භූමියක් වෙන් කර ගැනීමට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම එකී වෙන් කිරීම අපේක්ෂා කරන දිනයට අවම වශයෙන් දින තුනකට පෙර සිදු කළ යුතුය.

05. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ වෙන් කරන ගන්නා ලද කිසියම් ක්‍රීඩා භූමියක එකී වෙන් කර ගැනීම අවලංගු කරවා ගැනීමට යම් ඉල්ලුම්කරුවෙකුට අවශ්‍ය වන අවස්ථාවක පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ඒ සඳහා අවසර ලබා දීමට වරකාපොල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හැකිය

*(අ)* වෙන් කිරීම අවලංගු කිරීමට ඉල්ලීම කරනු ලබන්නේ ක්‍රීඩා භූමිය වෙන් කර ගනු ලැබූ දිනට,

1. මාස තුනකට පෙර වන විට ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පහක්,
2. මාස දෙකකට පෙර වන විට ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට දහයක්,
3. මාසයකට පෙර වන විට ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පහළොවක්,
4. දින පහළොවකට පෙර වන විට ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට විසිපහක්,
5. දින හතකට පෙර වන විට ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පනහක්
6. දින තුනකට පෙර වන විට ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට හැත්තෑ පහක්,

ප්‍රාදේශීය සභා අරමුදලේ රඳවා ගැනීමට යටත්ව විය යුතුය.

*(ආ)* වෙන් කිරීම අවලංගු කිරීමට ඉල්ලීම කරනු ලබන්නේ ක්‍රීඩා භූමිය වෙන් කර ගනු ලැබූ දිනට දින තුනකට වඩා අඩු කාලයකදී නම් ගෙවනු ලැබූ ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

*(ඇ)* කිසියම් වෙන් කිරීමක් අවලංගු කරවා ගනු ලැබූ විටකදී එකී වෙන් කර ගැනීම සඳහා ගෙවනු ලැබූ තැන්පත් මුදල සම්පූර්ණයෙන් ලබා ගැනීමට ඉල්ලුම්කරුට හිමිකම ඇත.

*(ඈ)* කිසියම් තැනැත්තෙකු විසින් වෙන් කර ගනු ලැබූ ක්‍රීඩා පිටියක් වෙන් කර ගත් කාර්යයට හැර වෙනත් කවර හෝ කාර්යකට යොදා ගැනීම නොකළ යුතුය.

*(ඉ)* ක්‍රීඩා භූමියක් වෙන් කිරීමට නිකුත් කරන ලද අවසර පත්‍රයක් කවර හෝ හේතුවක් මත වෙනත් තැනැත්තෙකුට පැවරීම නොකළ යුතුය.

06. කිසියම් කාර්යයක් සඳහා වෙන් කර ගනු ලැබූ ක්‍රීඩා භූමියක් එසේ වෙන් කර ගත් දිනය වෙනස් කර ගැනීමට අවශ්‍ය නම් ඉල්ලුම්කරු විසින් ඒ පිළිබඳව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත ලිඛිතව දැන්විය යුතුය. එකී ඉල්ලීම අනුව වෙන් කළ දිනය සංශෝධනය 3 වන සහ 4 වන අතුරු ව්‍යවස්ථාවල නියමයන්ට යටත්ව විය යුතුය.

07. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල දැක්වෙන විධිවිධාන අනුව ක්‍රීඩා භූමියක් කිසියම් කාර්යයක් සඳහා වෙන් කර නොමැති කවර හෝ අවස්ථාවක එකී ක්‍රීඩා භූමිය ක්‍රීඩා කිරීම හෝ ක්‍රීඩා පුහුණු වීම් කටයුතු සඳහා ලබා දීමට සභාපතිවරයාට හැකියාව ඇත.

08. ක්‍රීඩා භූමියක් පරිහරණය සඳහා කිසියම් පිළිගත් දේශපාලන පක්ෂයකට රාජ්‍ය ආයතනවල යම්කිසි උත්සව කටයුත්තකට හා ජාතික උත්සවයකට ගාස්තු අය කිරීමකින් තොරව ලබා දීමට ප්‍රාදේශීය සභාවේ මහා සභාව මගින් යෝජනා සම්මත කරවාගනු ලබන කොන්දේසීන්ට යටත්ව සිදු කිරීමේ බලය සභාවේ සභාපතිවරයාට ඇත.

09. ක්‍රීඩා භූමිය වෙන් කර ගනු ලැබූ කාල සීමාවට වඩා වැඩිපුර යොදා ගනු ලැබූ කාලය වෙනුවෙන් තෙවන උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු අය කරනු ලැබේ.

10. කවර හෝ තැනැත්තෙකු විසින් වරකා පොල ප්‍රාදේශීය සභාව සතු කිසියම් ක්‍රීඩා භූමියකට හානි පැමිණවීමට හෝ එසේ හානි වීමට සැලැස්වීම නොකල යුතු අතර, ක්‍රීඩා භූමිය තුළට ගවයන් ආදී සතුන් ඇතුල් කිරීම නොකල යුතුය. එසේම තව දුරටත් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් ලබාගත් අවසරයක් නොමැතිව කිසිදු වාහනයක් කවර හෝ ක්‍රීඩා භූමියකට ඇතුල් කිරීම නොකළ යුතුය.

11. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ වෙන් කර ගනු ලැබූ කිසියම් ක්‍රීඩා භූමියක් එසේ වෙන් කර ගනු ලැබූ දිනයේදී වරකාපොල ප්‍රාදේශීය සභාවේ කිසියම් අත්‍යාවශ්‍ය කාර්යයක් සඳහා අවශ්‍ය වන විටක එකී වෙන් කිරීම අවලංගු කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය. එසේ වුවද එවැනි අවලංගු කිරීමක් සිදු කරනු ලබන්නේ නම් එකී අවලංගු කිරීම ක්‍රීඩා භූමිය වෙන් කරනු ලැබූ

දිනට දින තුනකට පෙර ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දිය යුතුය. එමෙන්ම ඔහු විසින් ගෙවන ලද ගාස්තුව සහ තැන්පත් මුදල සම්පූර්ණයෙන්ම ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතුය. තව දුරටත් එසේම එවැනි අවලංගු කිරීමක් වෙන් කරගනු ලැබූ දිනට පෙර දින තුනකට වඩා අඩු කාලයකදී සිදු නොකල යුතුය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඇතුලත් ඕනෑම වගන්තියක් උල්ලංඝනය කිරීම හෝ නොකර හැරීම වරදක් වන අතර කිසියම් තැනැත්තෙකු නිසි අධිකරණ බලය සහිත අධිකරණයකින් වරදකට වරදකරු කරනු ලැබූ විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තිය අනුව නියම කර ඇති දඩයකින්ද වරදක් කරනු ලැබීමෙන් පසු එම වරද දිගින් දිගටම කරනු ලබයි නම් එකී කඩ කිරීම් කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ ඔවුන් විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසුවද එකී වරද කරගෙන යනු ලබන සෑම දිනයක් සඳහාම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තිය අනුව නියම කර ඇති අතිරේක දඩයකට යටත් විය යුතුය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ කිසියම් වගන්තියක අර්ථය සම්බන්ධයෙන් අනනුකූලතාවයක් ඇති වුවහොත් මෙහි සිංහල පිටපත සෑම අවස්ථාවකම බලාත්මක විය යුතුය.

14. මෙම අතුරු ව්‍යවස්ථාවේ,

ප්‍රාදේශීය සභාව යන්නෙන් ''වරකාපොල ප්‍රාදේශීය සභාවද''

සභාපතිවරයා යන්නෙන් ''වරකාපොල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාද''

ලේකම් යන්නෙන් ''වරකාපොල ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාද''

බලය පවරන නිලධාරී යන්නෙන් ''සභාපතිවරයා විසින් බලය පවරන ලද වරකාපොල ප්‍රාදේශීය සභාවේ නිලධාරියෙකුද'' අදහස් වේ.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල, ප්‍රාදේශීය සභාව විසින් වෙන් කර දෙනු ලැබූ කිසියම් ක්‍රීඩා භූමියක් අදහස් වන අතර ක්‍රීඩා භූමිය වටා ඉදිකර ඇති තාප්පය හෝ වැට හෝ ඒ තුළ ඉදිකර ඇති යම් ගොඩනැගිල්ලක් හෝ ඒ කිසියම් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමක කොටසක් හෝ කිසියම් සවි කිරීමක් හෝ උපකරණද ඊට ඇතුලත් විය යුතුය.

ක්‍රීඩාව යන්නෙන් 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ ඊට දී ඇති අර්ථයම අදහස් විය යුතුය.

**පළමු උපලේඛනය**

***වරකාපොළ ප්‍රාදේශීය සභාවේ............................ ක්‍රීඩා භූමිය පරිහරණය සඳහා අවසර ලබා ගැනීමේ ඉල්ලුම්පත්‍රය***

01. ඉල්ලුම්කරුගේ නම :————————————.
02. ලිපිනය :————————————.
03. දුරකථන අංකය :————————————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :————————————.
05. ක්‍රීඩා භූමිය අවශ්‍ය කාරණය :————————————.
06. අවශ්‍ය කරන දිනය හා වේලාව :————————————.

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙම ඉල්ලීමට අනුව.................................. ක්‍රීඩා භූමිය වෙන් කර දෙනු ලැබුවහොත් එම ක්‍රීඩා භූමියේ ගොඩනැගිලිවලට ඉදිකිරීම්වලට උපකරණවලට හෝ සවිකිරීම්වලට කිසිදු හානියක් වුවහොත් එහි අලාභය තැන්පත් මුදලින් අයකිරීම පිළිබඳව කිසිදු විරෝධතාවයක් නොමැති බවත් එකී තැන්පත් මුදල ඒ අයකිරීම් සඳහා ප්‍රමාණවත් නොවන්නේනම් තවදුරටත් අවශ්‍ය වන මුදල් ප්‍රාදේශීය සභාවට ගෙවීමටත් එකඟ වෙමි. එසේම ක්‍රීඩා භූමි විධිමත් කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පිළිපැදීමට එකඟ වෙමි.

————————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————————.

*දෙවන උපලේඛනය*

ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීම සඳහා පහත සඳහන් පරිදි ගාස්තු අය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| 1. | ක්‍රීඩා භූමියක් දිනකට කුලියට දීමේ ගාස්තුව - | රු. 3,000 0 |
| 2. | තැන්පත් මුදල | රු. 1,000 0 |

ඉහත සඳහන් පරිදි ක්‍රීඩා භූමි වෙන් කිරීමේ ගාස්තුව සහ තැන්පත් මුදල් ගෙවීමෙන් අනතුරුව පමණක් අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

*තෙවන උපලේඛනය*

කිසියම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබූ ක්‍රීඩා භූමියක් අදාල කාර්යය සඳහා පාවිච්චි කිරීමෙන් අනතුරුව වරකාපොල ප්‍රාදේශීය සභාවේ තැන්පත් කරනු ලැබූ තැන්පත් මුදලෙන්,

(1) ක්‍රීඩා භූමිය සතු චංචල හෝ නිශ්චල දේපලකට කිසියම් අලාභයක් සිදුවුවහොත් එම අලාභයේ වටිනාකම සහ,

(2) ක්‍රීඩා භූමිය වෙන් කර ගනු ලැබූ කාල සීමාවට වඩා වැඩිපුර යොදා ගනු ලැබූ කාලය වෙනුවෙන් අය කර ගත් ගාස්තුව, අඩුකර ගැනීමෙන් අනතුරුව ඉතිරිවන යම් මුදලක් පමණක් ඉල්ලුම්කරුට ආපසු ගෙවනු ලැබිය යුතුය.

04-05

---

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව - කුලියාපිටිය**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9.3 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිළධාරී වන මම 2016.01.01 දිනැති අංක 1948 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (ආ) වැනි කොටස -පළාත් පාලන *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද නිවාස දේපළ සංවර්ධනය සහ ඉඩම් කට්ටි කර විකිණීමට අද ාල අතුරු ව්‍යවස්ථාව පිළිගැනීමේ යෝජනාව පහත පරිදි නිවැරදි කිරීමට වර්ෂ 2017 ක් වූ මාර්තු මස 14 වැනි දින අංක 4870 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

නිවැරදි කරන ලද තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 වන අධිකාරය වන, 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්ප ා දනය කරනු ලැබූ 2003.11.28 වන දින අංක 1317 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv(අ) වැනි කොටස - පළාත් සභා *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද වයඹ පළාතේ නිවාස දේපළ සංවර්ධනය සහ ඉඩම් කට්ටිකර විකිණීමට අදළ අතුරු ව්‍යවස්ථාව හා එකී ගැසට් නිවේදනය පරිච්ඡින්න කරමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට් පත්‍රයේ* 2014.10.01 වන දින අංක 1882/22 අංකයෙන් ප්‍රකාශයට පත්කරනු ලද්ද වූද, නිවාස දේපළ සංවර්ධනය සහ ඉඩම් කට්ටිකර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හා එකී *ගැසට් නිවේදනයට* සංශෝධන වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට් පත්‍රයේ* 2015.01.20 වන දින අංක 1898/28 අංකයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූද නිවාස දේපළ සංවර්ධනය සහ ඉඩම් කට්ටි කර විකිණීමට අදාල අතුරු ව්‍යවස්ථාවට අදාළ සංශෝධන හා 2014.10.01 වන දින අංක 1882/22 අංකයෙන් ප්‍රකාශයට පත් කරනු ලද්ද වූ, නිවාස දේපළ සංවර්ධනය සහ ඉඩම් කට්ටි කර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කරමින් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ද, 2015.08.28 වන දින අංක 1929/45 අංකයෙන් ප්‍රකාශයට පත් කරනු ලැද්ද වූ ද, නිවාස දේපළ සංවර්ධනය සහ ඉඩම් කට්ටි කර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අද ාළ සංශෝධන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017.04.01 වැනි දින සිට අදාළ විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් තීරණය කරමි.

ජේ. ඒ. එස්. ජයසිංහ,
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය,
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2017 මාර්තු මස 14 වැනි දින,
කුලියාපිටිය ප්‍රධාන කාර්යාලයේ දී ය.

04-06

**කොළඹ මහා නගර සභාව**

ගෝ ඝාතක ආඥාපනත (272 වැනි පරිච්ඡේදය)

මතු සඳහන් උපලේඛනයේ නම් සඳහන් අය විසින් එකී නම ඉදිරියෙන් විස්තර දක්වා ඇති ස්ථානයට 2017 වර්ෂය තුළ මස් විකිණීමට අදාළව කටයුතු පවත්වාගෙන යාම පිණිස ගෝඝාතක බලපත්‍ර ඉල්ලුම්කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව කොළඹ මහා නගර සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එය පිටපත් දෙකකින් යුත් සවිස්තර ලියවිල්ලක් වශයෙන් සකස් කර මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වී දින 14 ක් ඇතුලත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත්, ගෝඝාතක ආඥාපනතේ (272) වැනි අධිකාරිය 7(2) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

විතාන කුරුප්පු ආරච්චිගේ අනුර,
නාගරික කොමසාරිස් හා කොළඹ මහා නගර සභාවේ
බලතල හා කර්තව්‍යයන් ඉටු කිරීමේ නිලධාරි,
කොළඹ මහා නගර සභාව.

2017 මාර්තු මස 16 වැනි දින,
නගර ශාලාව,
කොළඹ 07.

## උපලේඛනය I

**1. පෞද්ගලික මස් වෙළෙඳ සැල්:**

*පෞද්ගලික එළුමස් වෙළෙඳසැල්*

| *අනු. අංකය* | *ටෙන්ඩර්කරුගේ නම* | *ස්ථානය* |
|---|---|---|
| 1. | ඒ. එච්. මොහොමඩ් සීනි මයා | අංක බී/ජී/07, මිහිඳු මාවත, කොළඹ 12 |

04-170

---

සංශෝධනයයි

**කොළඹ මහා නගර සභාව**

නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව

2017.01.06 දින පළකරන ලද අංක 2001 දරන *ගැසට් පත්‍රයේ* IV ආ කොටස - පළාත් පාලනය කොටසේ, විවිධ දැන්වීම් යටතේ පළකරන ලද 01-10 නිවේදනයේ උපලේඛන අංක 01 (ඇ) (1) —

ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ එම මණ්ඩලය මගින් අනුමත කර ඇත්තා වූ හෝ හෝටල්වලින්, නවාතැන් පලවල් වලින් හෝ භෝජන ශාලා වලින් අදාළ හෝටලයේ, නවාතැන් පලේ හෝ භෝජනාගාරයේ පසුගිය වර්ෂයේ මුළු ලැබීම් වලින් සියයට දශම පහක (0.5%) බලපත්‍ර ගාස්තුවක් 2017.01.01 වැනි දින සිට පනවා අය කිරීම ලෙස සංශෝධනය විය යුතුය.

පී. ඒ. ඩී. එම්. ඩී. පොන්වීර,
නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්).

2017 මාර්තු මස 24 වැනි දින,
කොළඹ මහා නගර සභාව,
කොළඹ 07.

04-242

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | ...137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. ගැසට් පත්‍රය නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ...... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොළොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැලකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2017** | | | |
| අප්‍රේල් | 2017.04.07 | සිකුරාදා | 2017.03.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.04.12 | බදාදා | 2017.03.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.04.21 | සිකුරාදා | 2017.04.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.04.28 | සිකුරාදා | 2017.04.12 | බදාදා | දහවල් | 12.00 |
| මැයි | 2017.05.05 | සිකුරාදා | 2017.04.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.05.12 | සිකුරාදා | 2017.04.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.05.19 | සිකුරාදා | 2017.05.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.05.26 | සිකුරාදා | 2017.05.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2017.06.02 | සිකුරාදා | 2017.05.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.06.09 | සිකුරාදා | 2017.05.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.06.16 | සිකුරාදා | 2017.06.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.06.23 | සිකුරාදා | 2017.06.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.06.30 | සිකුරාදා | 2017.06.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.